# 2022.12.15 වන දින පැවති බුත්තල ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීම් වාර්තාව (2022 දෙසැම්බර් මාසය )

**සහභාගිත්වය:-**

| | | |
|---|---|---|
| 1. නිකවත්තේ නන්දසිරි මැතිතුමා | - | ගරු සභාපති |
| 2. ඩබ්.ඒ. රංජිත් වික්‍රම ආරච්චි මැතිතුමා | - | ගරු උපසභාපති |
| 3. ශ්‍රියානන්ද කළුපහන මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 4. එම්.ජී.ලසන්ත පුෂ්ප කුමාර මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 5. ඉන්ද්‍රසේන ලියනආරච්චි මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 6. එච්.පී.සංජීව ප්‍රදීප් මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 7. එම්.ඩී.ඩබ්.ඒ.ප්‍රියදර්ශන මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 8. එච්.කේ.කේ.දේනුක කසුන්ජිත් මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 9. ඒ.එම්.එස්.සී.අත්තනායක මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. එච්.එම්.ජී.චන්ද්‍රදාස මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 11. ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. ලසන්ත ලක්මාල් මතහවීර මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13. ඩී.එම්.එස්.මධුහර්ෂණී චන්ද්‍රසේන මැතිතුමිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 14. පී.ඉන්ද්‍රාණී මුතුකුමාරණ මැතිතුමිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 15. ඩී.එම්.අනුලාවතී මැතිතුමිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 16. ආර්.එම්.එච්.ශාන්ති රත්නායක මැතිතුමිය | - | ගරු ප්‍රා දේශීය සභා මන්ත්‍රිනී |
| 17. ඩී.එම්.තිලකරත්න මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18. කේ.එල්.එස්.ආර්.ජයකොඩි මැතිතුමිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 19. ආර්.එම්.සුනිල් මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 20. ආර්.එම්.එම්.පී.රාජපක්ෂ මහත්මිය | - | සභා ලේකම් |

2022 දෙසැම්බර් මස ප්‍රාදේශීය සභා මාසික රැස්වීම 2022.12.15 වන දින පෙ.ව. 9.30 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බුත්තල ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේදී ආරම්භ වූ අතර ගරු උප සභාපති ඩබ්.ඒ.රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා, ලසන්ත ලක්මාල් මතහවීර මැතිතුමා, එම්.ජී.ලසන්ත පුෂ්පකුමාර මැතිතුමා, ආර්.එම්.සුනිල් මැතිතුමා,ශ්‍රියානන්ද කළුපහන මැතිතුමා, එච්.එම්.ජී.චන්ද්‍රදාස මැතිතුමා, පී.ඉන්ද්‍රාණී මුතුකුමාරණ මැතිතුමිය, ආර්.එම්.එච්.ශාන්ති රත්නායක මැතිතුමිය, ඩී.එම්.අනුලාවතී මැතිතුමිය, කේ.එල්.එස්.ආර්.ජයකොඩි මැතිතුමිය සභාව ආරම්භයේදී සභාවට පැමිණ සිටින ලදී. ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටින මන්ත්‍රී මණ්ඩලය ඇතුළු සියලු දෙනා පිළිගන්නා ලද අතර ආගම සිහිකිරීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

## 01.පසුගිය වාර්තාව සම්මත කර ගැනීම.

පසුගිය සභාවේ වාර්තාව සම්මත කර ගැනීමේ අවස්ථාව බවත්, එම වාර්තාවේ සංශෝධන තිබේනම් ඉදිරිපත් කර වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ඉන්ද්‍රාණී මුතුකුමාරණ අදහස් දක්වමින්**

සියලු දෙනාට සුභ දවසක් ප්‍රාර්ථනා කරමින් සුසාන භූමි සම්බන්ධව අංක 33 මහසෙන්පුර සුසාන භූමිය පැල්වත්ත මහසෙන්පුර වසමට අයත් වන බවත් පෙතියන්ආර සුසාන භූමිය කුකුරම්පොළ හංදියේ බවත් මුලේල්කුඹුර සුසාන භූමියක් නොමැති බවත් එය 6 කණුව සුසාන භූමිය බවද සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ලසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින්**

අංක 33 යටතේ තිබෙන මහසෙන්පුර සුසාන භූමිය ඉවත් කර අංක 34 යටතේ තිබෙන මුල්ලේකුඹුර සුසාන භූමිය 6 කණුව සුසාන භූමිය  ලෙස සංශෝධනය කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී පී.ඉන්ද්‍රාණි මුතුකුමාරණ මැතිතුමිය අදහස් දක්වමින්**

පොදු ළිං යටතේ අංක 4 ආරියපාල මහතාගේ නිවස අසල මහසෙන්පුර කියලා සඳහන් කරලා තිබෙන්නේ.එය පස්සර පාර පැල්වත්ත ග්‍රාම නිලධාරී වසම ලෙස නිවැරදි විය යුතුය. ගල්පොත්තේ ගෙදර අසල තිබෙන  පොදු ළිඳ අයිති වෙන්නේ පැල්වත්ත වසමට 6 කණුව  ,එච්.ජී.ශාන්ත මහතාගේ නිවස ඉදිරිපිට ඇති  ළිඳ භාවිතා නොකරන අතර එම ළිඳ අයිති වෙන්නේ  පැල්වත්ත වසමට.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.ඒ.රංජිත් වික්‍රමආරච්චි  මැතිතුමා අදහස් දක්වමින්**

13 වන පොදු ළිඳ  ගාමිණිපුර සුසාන භූමිය ගාමිණිපුර පීටර් මහතාගේ නිවස අසල යනුවෙන් සඳහන් වී ඇති ඇති අතර,එය පියදාස මහතාගේ නිවස අසල යනුවෙන් සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී.ඩබ්.ඒ.ප්‍රියදර්ශන මැතිතුමා අදහස් දක්වමින්**

අංක 11  පොදු ළිඳ යුදගනාව වැලිමඩයාය පාර උනාවටුන යනුවෙන් සඳහන් කර ඇති බවත් එය උනාවටුන යනුවෙන් සඳහන් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි  මැතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.01.05** යෝජනාවේ සංශෝධනයක් කරන්න තිබෙනවා.පැරණි පොළ භූමියේ ඉදිවන නව ගොඩනැගිල්ලේ කඩ කාමර ලබා දෙනු ලබන්නේ  දැනට ව්‍යාපාර කරගෙන යන ව්‍යාපාරිකයන් 13 දෙනාට පිළිවෙළට ව්‍යාපාර කරගෙන යන  ආකාරයට කඩ ලබා දෙනවා යන්න සඳහන් විය යුතු බවත් එය  සභා තීන්දුවෙත් සඳහන් වීම අවශ්‍ය බව ප්‍රකාශ කරන ලදී.
**සංශෝධනය නිවැරදි කිරීම**

<u>**පැවරුම් නියෝග මගින් අප සභාවට පවරා ගැනීමට ඇති සුසාන භූමි ඉඩම්  පිළිබඳ විස්තර**</u>

| අනු අංකය | භුක්ති විඳින ඉඩමේ  නම | පිහිටි ග්‍රාම නිලධාරී වසම |
|---|---|---|
| 1. | මිණිපුරගම සුසාන භූමිය | හොරිගලයාය, ඔක්කම්පිටිය |
| 2. | දඹෙපිටිය සුසාන භූමිය | මාලිගාවිල |
| 3. | නියදැල්ල සුසාන භූමිය | මාලිගාවිල |
| 4. | පුහුල්කොටුව සුසාන භූමිය | වැල්ලවාය පාර, ගලේකනත්ත, බුත්තල |
| 5. | බුරුතගොල්ල දඹෙයාය සුසාන භූමිය | දඹෙයාය, බුරුතගොල්ල |
| 6. | බුරුතගොල්ල පහළගම සුසාන භූමිය | බෝගස්හංදිය - බුරුතගොල්ල |
| 7. | මහගොඩයාය සුසාන භූමිය (එගොඩ වත්ත) | එගොඩවත්ත,බුත්තල |
| 8. | මහගොඩයාය සුසාන භූමිය (පුනස්ථාපන ගම්මානය) | මහගොඩයාය |
| 9. | මහගොඩයාය සුසාන භූමිය (වැව අසල ) | මහගොඩයාය |
| 10. | ඔක්කම්පිටිය සුසාන භූමිය | ගල්කොටුවහේන, ඔක්කම්පිටිය |
| 11. | වෙහෙරගල සුසාන භූමිය | කුඩාඔය, බුත්තල |

| | | |
|---|---|---|
| 12. | පෙට්ටගම්වෙල සුසාන භූමිය | මිහිදුවෙලේහේන, බුත්තල |
| 13. | වැලමිටඋල්ල පොදු සුසාන භූමිය | වැලමිටඋල්ල, බුත්තල |
| 14. | ගල්ටැම්මණ්ඩිය සුසාන භූමිය | ගල්ටැම්මණ්ඩිය, ඔක්කම්පිටිය, සමගිපුර-2 |
| 15. | ගල්ටැම්මණ්ඩිය සුසාන භූමිය (සමගිපුර) | ගල්ටැම්මණ්ඩිය, ඔක්කම්පිටිය |
| 16. | කෝන්කැටිය සුසාන භූමිය | මහයාය, වගුරුවෙල, බුත්තල |
| 17. | කෝන්කැටිය සුසාන භූමිය | කතරගම පාර, බුත්තල |
| 18. | කෝවිල් පැලැස්ස සුසාන භූමිය | කුකුරම්පොල |
| 19. | පෙතියංආර සුසාන භූමිය | පෙතියංආර, කුකුරම්පොල |
| 20. | උළුගල 6 ඇළ සුසාන භූමිය | උළුගල |
| 21. | උළුගල 4 ඇළ සුසාන භූමිය | උළුගල |
| 22. | උළුගල 102 ඇළ සුසාන භූමිය | උළුගල |
| 23. | යුදගනාව ජනපද පොදු සුසාන භූමිය | යුදගනාව ජනපද පාර |
| 24. | 19 කණුව පොදු සුසාන භූමිය | කතරගම පාර, බුත්තල(ගෝනගංආර) |
| 25. | උඩගම සුසාන භූමිය | දික්යාය, බුත්තල |
| 26. | වගුරුවෙල සුසාන භූමිය | කතරගම පාර, වගුරුවෙල, බුත්තල |
| 27. | වලුගොල්ල සුසාන භූමිය | යටියල්ලාතොට |
| 28. | යටියල්ලාතොට සුසාන භූමිය | යටියල්ලාතොට ප්‍රජා ශාලාව අසල |
| 29. | කුමාරගම සුසාන භූමිය | ජනාවාස, කුමාරගම |
| 30. | පැල්වත්ත සුසාන භූමිය | කුඩා ඔය, පැල්වත්ත, බුත්තල |
| 31. | පැල්වත්ත සුසාන භූමිය | පස්සර පාර ,පැල්වත්ත |
| 32. | හොරබොක්ක සුසාන භූමිය | 15 කණුව,ඌව පැල්වත්ත |
| 33. | 6 කණුව සුසාන භූමිය | 6 කණුව,පැල්වත්ත |
| 34. | උඩඅරාව සුසාන භූමිය | උඩඅරාව |
| 35. | කුමාරපුර සුසාන භූමිය | ජනාවාස |

| අනු අංක | භුක්ති විඳින ඉඩමේ නම | පිහිටි ග්‍රාම නිලධාරි වසම |
|---|---|---|
| 01 | පහළවත්ත ඉන්ද්‍රකුමාර මහතාගේ නිවස අසල | මහසෙන්පුර |
| 02 | කුකුරම්පොල පාර ඊ.ජේ.ජයවීර මහතාගේ නිවස අසල | මහසෙන්පුර |
| 03 | කුකුරම්පොල පාර රංජි මහතාගේ නිවස අසල | මහසෙන්පුර |
| 04 | ආරියපාල මහතාගේ නිවස අසල | පැල්වත්ත |
| 05 | ගල්පොත්තේ ගෙදර අසල | පැල්වත්ත |
| 06 | 06 කණුව,එච්.ජී.ශාන්ත මහතාගේ නිවස ඉදිරිපිට | පැල්වත්ත |
| 07 | පැල්වත්ත පොළපිටිය අසල | පැල්වත්ත |
| 08 | වෙහෙරගල බුරුත හංදිය ගමගේ ස්ටෝර්ස් අසල | පැල්වත්ත |
| 09 | ආර්.ජී.පද්මසිරි මහතාගේ නිවස අසල | උනාවටුන |
| 10 | සමීර මහතාගේ නිවස අසල | උනාවටුන |

| | | |
|---|---|---|
| 11 | උනාවටුන වැලිමඩයාය පාර අසල | උනාවටුන |
| 12 | පෙට්ටගම්වල පොළ කරන චන්දන මහතාගේ නිවස ඉදිරිපිට | පෙට්ටගම්වල |
| 13 | ගාමිණිපුර පියදාස මහතාගේ නිවස අසල | ගාමිණිපුර |
| 14 | 2 කණුව සුදුසේන මහතාගේ ඉඩමේ | ගාමිණිපුර |
| 15 | ගල්පීල්ල අලවතු මහතාගේ නිවස අසල | ගල්ටම්මණ්ඩිය |
| 16 | 17 හංදිය | ගල්ටම්මණ්ඩිය |
| 17 | ගල්කටාර පියදාස මහතාගේ ඉඩම අසල | ගල්ටම්මණ්ඩිය |
| 18 | මැදපාර නුවර මහතාගේ ඉඩම අසල | ගල්ටම්මණ්ඩිය |
| 19 | බදුලු ගම්මානයේ රත්නපුර මහතාගේ ඉඩම අසල | ගල්ටම්මණ්ඩිය |
| 20 | හිටපු උපසභාපතිගේ නිවස අසල | ඔක්කම්පිටිය |
| 21 | උළුගෙදර මහතාගේ ඉඩම අසල | ඔක්කම්පිටිය |
| 22 | අරාවේ නිවස අසල | ඔක්කම්පිටිය |
| 23 | පහළගම ආර්.එම්.හින්නි මහතාගේ නිවස අසල | ඔක්කම්පිටිය |
| 24 | එන්.එම්.ගුණසේකර මහතාගේ නිවස අසල | ඔක්කම්පිටිය |
| 25 | 14 ඉඩමේ | ඔක්කම්පිටිය |

එමෙන්ම දැනට ව්‍යාපාර කරගෙන යන ව්‍යාපාරිකයන් 13 දෙනාට පිළිවෙළට ව්‍යාපාර කරගෙන යන ආකාරයට කඩ ලබාදීමටත්, කඩ ටෙන්ඩර් නොකර තක්සේරු වටිනාකම ලබාදීමට සුදුසු බවත් අනෙක් ඉල්ලීම්වලට එකඟතාවයක් ලබාදීම සිදු කළ නොහැකි බව පැහැදිලි කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසුව, කැඩීයන කඩකාමර තුන සඳහා කතරගම පාර දෙසට වන්නට නව ගොඩනැගිල්ල ඉදිවන ආකාරයටම 15*12 කඩ දෙකක් ඉදිකළ යුතු බවත්,පොල් තෙල් මෝල සහිත කඩය වෙනුවෙන් විමලතුංග සුසාන භූමියට මුහුණලා නව ගොඩනැගිල්ලේ 10*10 පළමු කඩ කාමර ලබාදීමටත්, දැනට ව්‍යාපාර කරගෙන යන ව්‍යාපාරිකයන් 13 දෙනාට පිළිවෙළට ව්‍යාපාර කරගෙන යන ආකාරයට කඩ ලබාදීමටත් , දැනට ව්‍යාපාරික ස්ථාන ඇති අයට කඩ කාමර ලබාදීමේදී ටෙන්ඩර් නොකර තක්සේරු වටිනාකමට එම කඩ ලබාදීමටත් අනුමත වූ අතර, එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සභා සම්මත විය. .

2022.12.15 දින පැවැති මාසික සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලසන්ත ලක්මාල් මතඟවීර මැතිතුමා විසින් යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශ්‍රියානන්ද කළුපහන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසුව, බෙදීමක් නොවූයෙන් පසුගිය සභා වාර්තාව කියෙව්වා සේ සලකා ඒකමතිකව සභා සම්මත කරන ලදී.

පෙ.ව 9.40 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී.සංජීව ප්‍රදීප් මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.එස්.සී.අත්තනායක මැතිතුමා ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.තිලකරත්න මැතිතුමා පැමිණෙන ලදී.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන.**

අධ්‍යක්ෂ ජනරාල්,ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2022.11.22 දිනැතිව ලිපියක් ඉදිරිපත් කර තිබේ.

සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීම

ඉහත කරුණට අදාලව බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත යොමු කරන ලද අංක බු/ප්‍රාස/පොදු සහිත ලිපිය සහ ජනාධිපති කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් (මහජන සම්බන්ධතා)

විසින් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරන ලද අංක PS/PR/24/05/431601 හා 2022.10.25 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, ඔබ අමාත්‍යාංශය විසින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන වැඩසටහන් මගින් බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් යොමු කර ඇති බුත්තල ප්‍රදේශයට අදාල වන සංවර්ධන යෝජනා ද ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

03.මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව ජනාධිපති ලේකම් සහ මෙම දෙපාර්තමේන්තුව වෙතද පිටපතක් සහිතව බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

මෙම ලිපිය අපගේ ජයග්‍රහනයක් බව පවසන ලදී.

පෙ.ව 9.55 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.එම්.එස්.මධුහර්ෂණී චන්ද්‍රසේන මැතිතුමිය හා ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා පැමිණෙන ලදී.

පෙ.ව 9.57 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්ද්‍රසේන ලියනආරච්චි මැතිතුමා පැමිණෙන ලදී.

**03.සභාවට ඉදිරිපත් කරන පෙත්සම් පැමිණිලි හා සංදේශ ඉදිරිපත් කිරීම**

**01.**ගරු ආණ්ඩුකාරතුමාගේ අංක GUP/PS/GOV/LGO/N2022-L019 දරණ 2022.11.29 දිනැතිව ඌව පළාත් අධ්‍යාපන හා පළාත් පාලන අමාත්‍යාංශය,බදුල්ල වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත.ස්ථානමාරු ලිපිය සම්බන්ධවයි.ශිර්ෂ ගත කරුණට අදාලව බුත්තල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති නන්දසිරි නිකවත්ත මැතිතුමා විසින් 2022.11.23 දිනැතිව මා වෙත යොමු කරන ලද ලිපියේ ඡායාස්ත පිටපතක් සුදුසු කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

**02.**උනාවටුන හරිගලගම පිවිසුම් මාර්ග සංසදය විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත.උනාවටුන ග්‍රාම නිලධාරී වසමේ හරිගලගමට පිවිසෙන මාර්ගය සකස්කර ගැනීම සඳහා ශ්‍රමදානයක් සංවිධානය කර ඇති බවත්,ඉන්ධන හරිගලගම ගම්වාසීන් විසින් සපයා ගන්නා බවත්,මොටර් ග්‍රේඩර් යන්ත්‍රය ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී.ඩබ්.ඒ.ප්‍රියදර්ශන මැතිතුමා ලිපියක් ඉදිරිපත් කර ඇත.උනාවටුන හරිගලගමට යන ප්‍රධාන මාර්ගයේ 150 m දුරට මොටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදවා සකස් කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත. ප්‍රදේශයේ ජනතාව අවශ්‍ය තෙල් ලබාදෙන බව සඳහන් කර තිබේ.

04.මිනිපුරගම පලුකපිටිය වැව ගොවි සංවිධානය මගින් 2022.12.14 දිනැතිව ලිපියක් ඉදිරිපත් කර තිබේ. මිනිපුරගම ප්‍රධාන මාර්ගය සම්බන්ධව. මිනිපුරගම ප්‍රධාන මාර්ගය දැනට වසර ගණනාවක් පැරණි මාර්ගයකි. මෙය ඉතා අබලන් වී ඇත. මෙම මාර්ගයේ කාණු පිරී ගොස් ඇත. වැසි අධික නිසා දැනට වාහනයකින් යාම පවා අසීරු තත්ත්වයකට පත්ව තිබේ. මිනිපුරගම සිවිල් ආරක්ෂක ග්‍රාමීය කමිටුව, ඔක්කම්පිටිය පොලිසිය සහ ඔක්කම්පිටිය පොලිසිය ගම්වාසීන්ගේ සහය ඇතිව ග්‍රැවල් දමා මාර්ගය සාදා ගැනීමට තීරණය කරන ලදී.ඒ සඳහා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත.

05.සභාපති, අපමිතුරු මරණාධාර සමිතිය ජනාවාස අංක 06 කුමාරගම ලිපිනයේ 2022.12.15 දිනැතිව ලිපියක් ඉදිරිපත් කර තිබේ. එඬරුගලයාය ජනාවාස 06 යා වන මාර්ග සම්බන්ධව ජනාවාස 04,05,09,10,11,14,15,16 යන සියල්ලන්ගේම ප්‍රධාන කෙටි මාර්ගයක් වන එඬරුගලයාය හරහා කුකුරම්පොල පැල්වත්ත සීනි සමාගම දක්වා දිවෙන මාර්ගය එඬරුගලයාය කෝවිල්පැලැස්ස යා වන ස්ථානයේ විශාල ලෙස වලවල් රැසක් හැරි ඇත. පාසල් බස්රථ , ලංගම බස් රථ හා පෞද්ගලික බස්රථ කිහිපවාරයක් මෙම මාර්ගයේ ගමන් කරන අතර බස්රථ මාර්ගය තුලින් පෙරලී යාමට පවා සිදු වූ අවස්ථා

ඇත. එම නිසා ප්‍රාදේශීය සභාව සතු ජේ.සී.බී.යන්ත්‍රය සහ ටිපර් රථ ලබා දී අප ප්‍රදේශයේ ඇති ග්‍රැවල් වලින් සපයා ගෙන දමා මාර්ගය පිළිසකර කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත.

06.මංගල මහිලාල් විජේනායක,පළාත් පාලන කොමසාරිස් - ඌව පළාත,පළාත් පාලන කොමසාරිස් දෙපාර්තමේන්තුව,බදුල්ල යන ලිපිනයෙන් 2022 දෙසැම්බර් මස 02 වැනිදා එවා ඇති ලිපියට අනුව වර්ෂ 2022 නොවැම්බර් මස 03 වන දිනැති අස්කිරීමේ දැන්වීම සම්බන්ධයෙනි.

මාගේ සේවාදායකයා වන අංක 11 හා 12 කෙලින් වීදිය බුත්තල ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යනු ලබන හේවා වල්ගමගේ රොහාන් චතුරංග දෙනිපිටිය යන අයගේ උපදෙස් මත ඔබ වෙත ලියා දන්වා සිටිමි.

මාගේ සේවා දායකයා විසින් හා ඔහුගේ පියා වන හේවා වල්ගමගේ කුලසේන දෙනිපිටිය යන අය විසින් ශත වර්ෂ 02/03 එපිට සහ නිසි අයිතිවාසිකම් මත භුක්ති විදගෙන එනු ලබන බුත්තල ප්‍රධාන වීදියේ පිහිටි අංක 11 සහ 12 දරණ කඩ කාමර 02 හි භුක්තිය නීති විරෝධි හා අනීතිකව ලබා ගැනීමට කරන ලද ඔබගේ 2022.11.03 වන දින දරණ ලිපිය සම්බන්ධව මාගේ සේවා දායකයා විසින් සිය විරෝධය හා අප්‍රසාදය මෙයින් දන්වා සිටිමි.

අංක 01 - ඉහත කී කඩ කාමර සම්බන්ධයෙන් වැල්ලවාය දිසා අධිකරණයේ L-47දරණ නඩුව හා එම අධිකරණයේම L-46 දරණ නඩු නියෝගයන්ට පටහැනිව සහ ඒ සම්බන්ධයෙන් කිසිදු අවබෝධයකින් තොරව ඔබ විසින් අනීතිකව එකී නෙරපීම් නියෝග නිකුත් කර තිබීම.

අංක 02 - මාගේ සේවා දායකයා විසින් හා ඔහුගේ පූරෝගාමීන් විසින් සත වර්ෂ 02/03 ට වැඩි කාලයක් එකී දේපළ තුළ නීත්‍යානුකූලව කටයුතු පවත්වාගෙන යාම හා ඒ මත කිසිදු පදනමකින් තොරව සහ අධ්‍යනයකින් තොරව නීති විරෝධිව නෙරපීම් නියෝගයක් නිකුත් කර තිබීම.

අංක 03 - ඔබ විසින් නෛතිකව ක්‍රියාමාර්ග අනුගමනය නොකර වැල්ලවාය දිසා අධිකරණයේ නියෝගයන්ට පටහැනිව සහ වැල්ලවාය දිසා අධිකරණයට අපහාස වන අයුරින් කටයුතු කිරීම.

අංක 04 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පුද්ගලයෙකුට ලබා දී ඇති මූලික අයිතිවාසිකම් වලට ගරු නොකර කටයුතු කිරීම මගින් මාගේ සේවා දායකයාගේ මූලික අයිතිවාසිකම් කඩ කිරීම.

ඌව පළාතේ මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය සභා සීමාවට අයත් බුත්තල නගරයේම පිහිටි පැරණි වෙළඳ සංකීර්ණ ඉඩමේ අංක 12 දරණ කඩ කාමරය පිහිටි ඉඩමේ සතර මායිම

උතුර - ප්‍රධාන මාර්ගය (කඩ කාමරය ඉදිරිපස)<br>
නැගෙනහිර-අංක 11 කඩ කාමරය<br>
දකුණ - බුත්තල පැරණි ප්‍රා දේශීය සභා පොල භූමිය<br>
බටහිර - අංක දරණ කඩ කාමරය වේ

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා අදහස් දක්වමින්**

ටී.ජී තිලකසිරි යන අයගේ 1995 ගිවිසුමක් තිබෙනවා. ටෙන්ඩර් පටිපාටිය යටතේ අරන් තියෙන්නේ එයා විතරයි ටෙන්ඩර් පටිපාටිය හිටියේ අනෙක් අය සාමන්‍ය කඩ ලැබුණු අය.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**

මේ කියන කාරණා සම්බන්ධව සභා ලේකම්තුමිය විෂය භාර නිලධාරී සියලු දෙනා යටතේ කමිටුවක් පත් කරගෙන සම්මුඛ පරීක්ෂණයක් සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.සුනිල් මැතිතුමා අදහස් දක්වමින්**

කඩ හිමියන්ට රු:5000.00 ක මුදලකට කඩ 26 ක් ලබා දුන්නා.තිලකසිරිට වෙනම කඩයක් ලබාදුන්නා.1987 ගම්උදාවෙන් ලබා දුන්න කඩ ටික ලබා දිය යුතුයි.පොළ සංවර්ධනය සඳහා ප්‍රමුඛතාවය දෙන්න යනුවෙන් යෝජනා කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී.සංජීව ප්‍රදීප් මැතිතුමා අදහස් දක්වමින්**

සභාවෙන් අවසරයි පසුගිය දිනක සිදු වූණ සිද්ධියක් මේක.ත්‍රීවිලර් රථගාල අසල කාණුවක පොඩි ගැහුණු දරුවෙක් වැටුණා.එම ස්ථානය ගොඩක් අවදානම්.එම නිසා සිමෙන්ති කොට්ට 05 ක් හා වැලි අරන් දීලා මේක හදමු.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**

හිතුමතේට මේක හදන්න නොහැකි බවත්,එහෙම හැදුවොත් RD එකට ප්‍රමිතිය පිළිබඳව වගකියන්න වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී.සංජීව ප්‍රදීප් මැතිතුමා අදහස් දක්වමින්**

එදා ඒ සිදුවීමෙන් ඒ දරුවා මැරෙනවා තව ටිකකින්. ප්‍රමිතිය නෙවෙයි එතනට කොඩියක් හරිදාලා සලකුණු කරන්න.තාවකාලිකව හරි ප්ලෙට් එකක් දාන්න.පාසල් ළමයි එතනින් යනවා.සිමෙන්ති කොට්ට 05 ක් දාලා හදලා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.ඒ.රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා අදහස් දක්වමින්**

RD එකට දීලා ඒ ප්ලෙට් එක හදන්න දෙමු.සිමෙන්ති කොට්ට 5 ක් හරි 10 හරි දීලා එක හදන්න කියලා මමත් යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා අදහස් දක්වමින්**

නගරය පිළිබඳව අපි සෑම වෙලාවකම අවධානය යොමු කරනවා.අඩුපාඩු සොයා බලනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී.සංජීව ප්‍රදීප් මැතිතුමා අදහස් දක්වමින්**

මේ සභාවේ දහස් ගණන් සල්ලි වියදම් කරනවා.මාස ගණනක් අපි මෙක ගැන මතක් කරනවා.තාවකාලිකව නෙවෙයි මේවා හෙට අනිද්දාම හදන්න.ක්‍රිකට් මැච් ගැහුවා ඒක නිසා මේවා හොයලා බලලා හදන්න. RD එකෙන් සිමෙන්ති ඉල්ලන්න ඕන නෑ.සභාපතිතුමා හදන්න.

**04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න :-**

කළුපහන මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද 2017 වර්ෂයේ සිට දෙණිපිටිය කඩ සම්බන්ධව යෝජනාවක් තිබෙනවා කළුපහන මන්ත්‍රීතුමාගේ ණය ගැති ලේඛනය නිවැරදි කර ගැනීම සම්බන්ධව

පැරණි පොළ භූමියේ ඉදිකරන ගොඩනැගිල්ලේ සමීක්ෂණ කටයුතු සඳහා පහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලාගේ නම් ගරු සභාවේ එකමතිතව යෝජනා කරන ලදී.

01. ගරු ප්‍රා දේශීය සභා උප සභාපති ඩබ්.ඒ.රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා
02. ගරු ප්‍රා දේශීය සභා මන්ත්‍රී ආර්.එම්.සුනිල් මැතිතුමා
03. ගරු ප්‍රා දේශීය සභා මන්ත්‍රී ශ්‍රියානන්ද කළුපහන මැතිතුමා
04. ගරු ප්‍රා දේශීය සභා මන්ත්‍රී එච්.පී.සංජීව ප්‍රදිප් මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශ්‍රියානන්ද කළුපහන මැතිතුමා අදහස් දක්වමින්**

තමුන්නාන්සේලා මේ දිනවල ප්‍රවෘත්ති බලනවා නම් දැරියන් දෙදෙනෙකු මත්ද්‍රව්‍ය පාවිච්චි කරලා කියලා ඊයෙත් ප්‍රවෘත්ති වලට සඳහන් කළා. අද විශ්ව විද්‍යාලයේ පවතින තත්ත්වය පිළිබඳව ගුරු සංගමයට අත්පත්‍රිකාවක් ගහන්න ඕනි. අපේ සභාවේ වියදමෙන් සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය දැනුවත් කරලා මේ දේවල් කරමු. සමාජ සත්කාරයක් වශයෙන් මේක අපෙන් විය යුතු යුතුකමක්.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා අදහස් දක්වමින්**

මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා ඉන්පසු මහජන නියෝජිතයන්, පන්සලේ හාමුදුරුවෝ,විදුහල්පතිවරුන් දැනුවත් කරන්න අවශ්‍යයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.ලසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින්**

වැල්ලවාය කලාපය හරහා කම්ටු රැස්වීමක් තිබුණා මත්ද්‍රව්‍ය පිළිබඳව ඒකට සහයෝගය දක්වමු කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා අදහස් දක්වමින්**

ඒ අයට යන්න ප්‍රවාහන පහසුකම් නැත්නම් කොට්ඨාසයේ ඉන්න දෙන්නා තුන්දෙනා එකතු වෙලා සභාවේ වියදමින් මේ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගනිමු.විදුහල්පතිවරුන් දැන්වත් කරලා කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී කේ.එල්.එස්.ආර්.ජයකොඩි මැතිතුමිය අදහස් දක්වමින්**

පොලිසිය, ග්‍රාම නිලධාරීන් දැනුවත් කරන්න අවශ්‍යයි කියලා මම යෝජනා කරනවා.

11.20 ගරු ප්‍රා දේශීය සභා මන්ත්‍රීනී පී.ඉන්ද්‍රාණි මුතුකුමාරණ මැතිතුමිය පිටව යන ලදී.

**05.යථා පරිදි කල්දී ඇති යෝජනා :-**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.01.01** බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගාමිණිපුර ග්‍රාම නිලධාරි වසමේ 2022.07.04 වන දින පිහිටුවන ලද "ගැමුණු" ප්‍රජා මණ්ඩලය හා රථගාල් ලියාපදිංචි කිරීම සඳහා ගරු සභාවේ අනුමැති යෝජනා කරන්නීය.

| අනු අංක | රථ සංගමයේ නම | ලිපිනය |
|---|---|---|
| 01 | අංක 01 ත්‍රිරෝද රථ සුභ සාධක සංගමය | ප්‍රධාන බස් නැවතුම්පල ඉදිරිපිට ,බුත්තල |
| 02 | සී/ස බුත්තල ත්‍රිරෝද රථ රියදුරු සංගමය | බස් නැවතුම්පල ඉදිරිපිට ,බුත්තල නගරය,බුත්තල |
| 03 | ඌව වෙල්ලස්ස එකමුතු ත්‍රිරෝද රථ සංගමය | අංක 2/3,කතරගමපාර (වම),බුත්තල නගරය,බුත්තල |
| 04 | උනාවටුන සමෘද්ධි බැංකුව අසල ත්‍රිරෝද රථ සංගම | උනාවටුන, බුත්තල |
| 05 | පැල්වත්ත ත්‍රිරෝධ රථහිමියන්ගේ සංගමය | ඌව පැල්වත්ත |
| 06 | වෙල්ලස්ස රජ මාවත ත්‍රිරෝද රථ සංගමය | අංක 04 බුත්තල |
| 07 | යුදගනාව හංදිය ත්‍රිරෝද රථ සංගමය | යුදගනාව හංදිය |
| 08 | උනාවටුන හංදිය ත්‍රිරෝද රථ සංගමය | උනාවටුන හංදිය |
| 09 | බුරුත හංදිය ත්‍රිරෝද රථ සංගමය | බුරුත හංදිය |

| | | |
|---|---|---|
| 10 | අම්බලන්පොත හංදිය ත්‍රිරෝද රථ සංගමය | අම්බලන්පොත හංදිය |
| 11 | කුකුරම්පොල හංදිය ත්‍රිරෝද රථ සංගමය | කුකුරම්පොල හංදිය |
| 12 | මහගොඩයාය හංදිය ත්‍රිරෝද රථ සංගමය | මහගොඩයාය හංදිය |
| 13 | බුත්තල දිසා රෝහල අසල ත්‍රිරෝද රථ සංගමය | බුත්තල දිසා රෝහල අසල |
| 14 | පුහුල්කොටුව හංදිය ත්‍රිරෝද රථ සංගමය | පුහුල්කොටුව හංදිය |
| 15 | දියකිරිත්ත හංදිය ත්‍රිරෝද රථ සංගමය | දියකිරිත්ත හංදිය |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.ඒ. රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසුව, එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**05.01.02** බුත්තල ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂට අදාල ප්‍රසම්පාදන කමිටුව තෝරා පත්කර ගැනීමට ගරු සභාවේ අනුමැතිය සඳහා යෝජනා කරන්නීය.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.ලසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ප්‍රසම්පාදන කමිටුව ලෙස**

සභාපති ගරු නිකවත්තේ නන්දසිරි මැතිතුමා (කමිටු සභාපති)
ගරු උප සභාපති ඩබ්.ඒ. රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා (කමිටු සාමාජික)
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී.සංජීව ප්‍රදීප් මැතිතුමා (කමිටු සාමාජික)
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී.ඩබ්.ඒ.ප්‍රියදර්ශන මැතිතුමා (කමිටු සාමාජික)

ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසුව, එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**05.01.03** විෂය නිලධාරී විසින් 2022.11.28 දිනැතිව ලිපියක් ඉදිරිපත් කරමින් ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතියේ දෙවන අධියර ($PT_2$) කාර්ය සාධන වාරිකයට අදාලව ක්‍රියාකාරකම් හඳුනා ගැනීමේ වැඩසටහනක් 2022.10.18 වන දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවැත් වූ අතර එහිදී කණ්ඩායම් 07 ක් හඳුනාගත් ව්‍යාපෘති යෝජනා 14 ක් 2022.11.09 වන දින පැවැත්වූ ව්‍යාපෘති කළමණාකරණ කමිටු රැස්වීමේදී ප්‍රමුඛතා ගත කරන ලදී.එම ප්‍රමුඛතා ගත කරන ලද යෝජනා 14 ගරු සභාවේ අනුමැතිය සඳහා යෝජනා කරන්නීය.

| ප්‍රමුඛතා අංකය | යෝජනා | ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01 | බුත්තල කර්මාන්ත පුරයේ දැනට පවතින කෘෂි නිෂ්පාදන ව්‍යවසායකයින්ට පහසුකම් සපයා දීම. (විජලන යන්ත්‍ර සැකසුම් යන්ත්‍ර යනාදී යන්ත්‍රෝපකරණ ලබා දීමට කටයුතු කිරිම | 92% |
| 02 | දේශීය ඖෂධ වර්ග මිලදී ගැනීමට මධ්‍යස්ථානයක් පිහිටු වීම. | 90% |
| 03 | බුත්තල ප්‍රදේශයේ අතිරික්ත පලතුරු එකතු කර මධ්‍යස්ථානයක් බිහිකර පලතුරු ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් අලුතින් ඉදිකිරිම. | 88% |
| 04 | අතිරික්ත නිෂ්පාදන තුළින් නව නිෂ්පාදන බිහි කිරීම. නව නිෂ්පාදන අපනයනය තුළින් විදේශ විනිමය ලබා ගත හැකි වීම. ඒ සඳහා එළවළු, පළතුරු මිලදී ගැනීමේ මධ්‍යස්ථාන ඇති කර එමගින් නව කර්මාන්ත ශාලාවන් ඇති කිරීම. | 88% |

| | | |
|---|---|---|
| 05 | බුත්තල නගරය ආශ්‍රිතව ඖෂධ සහ එළවළු විජලනය, පොල් කටු නිර්මාණ, පොල් කටු අඟුරු ආශ්‍රිත නිර්මාණ, ලුණු දෙහි, දිවුල්, කිතුල් හකුරු ආදී නිෂ්පාදන මධ්‍යස්ථානයක් ඇති කිරීම. | 75% |
| 06 | දේශීයව නිෂ්පාදනය කරනු ලබන එළවළු හා පළතුරු සහ ඒ ආශ්‍රිත අගය එකතු කල නිෂ්පාදන දේශීය හා විදේශීය වෙළඳපොළ වෙත යොමු කාරීම සඳහා කර්මාන්ත ශාලා ආශ්‍රිත හුවමාරු මධ්‍යස්ථානයක් පිහිටුවීම | 68% |
| 07 | වියදම් කළමණාකරනය සඳහා සේවාවන් වැඩි දියුණු කිරීම -මාර්ග ගත ක්‍රමයට සේවා සැපයීම. | 68% |
| 08 | දේශීය ඖෂධ හා කුළු බඩු එකතු කිරීමේ හා සැකසීමේ මධ්‍යස්ථානයක් ඇති කිරීම | 65% |
| 09 | ආහාර විජලනය කිරීමේ හා ඇසුරුම් මධ්‍යස්ථානයක් ඇති කිරීම | 61% |
| 10 | පලතුරු ආශ්‍රිත නිෂ්පාදන මධ්‍යස්ථානයක් ඇති කිරීම | 60% |
| 11 | බුත්තල නගරය සංචාරක මධ්‍යස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීම | 55% |
| 12 | ප්‍රදේශයේ පවතින වගා නොකරන ලද මුඩු ඉඩම් හඳුනාගෙන වගා කටයුතු සඳහා යොමු කිරීම. | 53% |
| 13 | යුධගනා වැව් තාවුල ආශ්‍රිත සංචාරක බෝට්ටු සේවයක් ඇති කිරීම. | 48% |
| 14 | ග්‍රාමීය මට්ටමින් අස්වැන්න මිල දී ගැනීමේ මධ්‍යස්ථානයක් බිහිකිරීම හා නගරය ආශ්‍රිත හුවමාරු මධ්‍යස්ථානයක් බිහි කිරීම.නව රැකියා අවස්ථා බිහි කිරීම. | 48% |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලසන්ත ලක්මාල් මතහවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශ්‍රියානන්ද කළුපහන මැතිතුමා අදහස් දක්වමින්**

මේවා අද ඊයේ කරන්න ඕන දේවල් නෙවෙයි. කලින් කරන්න තිබුණ ඒවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා අදහස් දක්වමින්**

මන්ත්‍රීතුමා මේක ලෝක ආධාර වැඩසටහනක්. ප්‍රදේශයේ ජනතාවගේ යෝජනා අරගෙන කරන එකක්

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශ්‍රියානන්ද කළුපහන මැතිතුමා අදහස් දක්වමින්**

මම කිව්වේ රටේ වෙන ඒවා ඔබතුමා නිවැරදි කරගෙන යන්න ඕනි.

ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසුව, එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**05.01.04** 2023 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කර ගැනීම සඳහා ගරු සභාවේ අනුමැතිය සඳහා යෝජනා කරන්නීය.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.සුනිල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසුව, එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**05.01.05** 2023 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම අනුමත කර ගැනීම සඳහා ගරු සභාවේ අනුමැතිය සඳහා යෝජනා කරන්නීය.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.සුනිල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.ඒ.රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා අදහස් දක්වමින්**

ගල්ටැම්මණ්ඩිය 17 හංදිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ අසල අප්පුහාමි මහතාගේ නිවස ඉදිරිපිට යනුවෙන් සඳහන් විය යුතුය. එම නම ක්‍රියාකාරී සැලැස්මේ වැරදි හදාගන්න. විෂයභාර නිලධාරින් දැනුවත් කරන්න.

ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසුව, එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**05.01.06** 2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය අනුමත කර ගැනීම සඳහා ගරු සභාවේ අනුමැතිය සඳහා යෝජනා කරන්නීය.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

| අනු අංක | නම | තනතුර | ආයතනය | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ පත්කර ඇති තනතුර |
|---|---|---|---|---|
| 01 | එච්.එම්.යූ.හේරත් මයා | විමර්ශන නිලධාරී | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය | කමිටු සභාපති |
| 02 | ටී.ජී.ගෝතමී කෞෂලායා මිය | ප්‍රජා සංවර්ධන නිලධාරී | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය | සාමාජික |
| 03 | ඊ.ඩී.එන්.මධුසංඛ මයා | සංවර්ධන නිලධාරී | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය | සාමාජික |
| 04 | ඩී.එම්.එස්.පී.දිසානායක මයා | ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරී | ප්‍රාදේශීය සභාව බුත්තල | සාමාජික |
| 05 | ආර්.ඩී.සුජීවා මිය | සංවර්ධන නිලධාරී | ප්‍රාදේශීය සභාව බුත්තල | සාමාජික |
| 06 | ආර්.එම්.නිරෝෂා ස්වර්ණමාලි මිය | සංවර්ධන නිලධාරී | ප්‍රාදේශීය සභාව බුත්තල | සාමාජික |
| 07 | ආර්.එම්.නයනා විරලතා මිය | සංවර්ධන නිලධාරී | ප්‍රාදේශීය සභාව බුත්තල | සාමාජික |
| 08 | යූ.ජී.පී.එම්. ප්‍රේමරත්න මිය | සංවර්ධන නිලධාරී | ප්‍රාදේශීය සභාව බුත්තල | සාමාජික |

ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසුව, එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**05.01.07** 2023 වර්ෂය සඳහා මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව, පරිසර හා පහසුකම් කාරක සභාව,නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව,තාක්ෂණික සේවා කාරක සභාව අනුමත කර ගැනීම සඳහා ගරු සභාවේ අනුමැතිය සඳහා යෝජනා කරන්නීය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.ලසන්ත පුෂ්පකුමාර මැතිතුමා පෙර වසරේ තිබූ කමිටු ඒ අයුරින්ම ක්‍රියාත්මක කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.ඒ අනුව,එම කමිටුව නම් කිරීම සුදුසු බවට මහ සභාව විසින් පොදුවේ තිරණය කරන ලදී.

<u>මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව</u>

1.නන්දසිරි නිකවත්ත මැතිතුමා - කමිටු සභාපති

2.ලසන්ත ලක්මාල් මතඟවීර මැතිතුමා - සාමාජික

3.ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා - සාමාජික

4.එච්.කේ.කේ.දේනුක කසුන්ජිත් මැතිතුමා - සාමාජික

5.ආර්.එම්.සුනිල් මැතිතුමා - සාමාජික

6.ඩී.එම්.එස්.මධුහර්ෂණි චන්ද්‍රසේන මැතිතුමි - සාමාජික

<u>පරිසර හා පහසුකම් කාරක සභාව</u>

1.ශ්‍රියානන්ද කළුපහන මැතිතුමා - කමිටු සභාපති

2.එම්.ඩී.ඩබ්.ඒ.ප්‍රියදර්ශන මැතිතුමා - සාමාජික

3.එච්.පී.සංජීව ප්‍රදීප් මැතිතුමා - සාමාජික

4.ඩී.එම්.එස්.මධුහර්ෂණි චන්ද්‍ර සේන මැතිතුමිය - සාමාජික

<u>නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව</u>

1.ඩබ්.ඒ.රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා - කමිටු සභාපති

2.ඒ.එම්.එස්.සී.අත්තනායක මැතිතුමා - සාමාජික

3.එම්.ඩී.ලසන්ත පුෂ්පකුමාර මැතිතුමා - සාමාජික

4.පී.ඉන්ද්‍රානි මුතුකුමාරණ මැතිතුමිය - සාමාජික

<u>තාක්ෂණික සේවා කාරක සභාව</u>

1.ඉන්ද්‍ර සේන ලියනආරච්චි මැතිතුමා - කමිටු සභාපති

2.ජී.එම්.තිලකරත්න මැතිතුමා - සාමාජික

3.එච්.එම්.ජී.චන්ද්‍රදාස මැතිතුමා - සාමාජික

4.ආර්.එම්.එච්.ශාන්ති රත්නායක මැතිතුමිය - සාමාජික

ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසුව, එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**05.01.08** 2023 වර්ෂයට ආදායම් සමීක්ෂණ සකස් කිරීමට අදාල ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ගතයුතු අතර,ඒ සඳහා අවශ්‍ය කමිටුව අනුමත කර ගැනීම සඳහා ගරු සභාවේ අනුමැතිය සඳහා යෝජනා කරන්නීය.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උපසභාපති ඩබ්.ඒ.රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

1.ආර්.එම්.එම්.පි.රාජපක්ෂ මිය - සභා ලේකම් - කමිටු සභාපති

2.කේ.ජී.එන්.ක්‍රිෂාන්ති මිය - සංවර්ධන නිලධාරි - කමිටු සාමාජික

3.ආර්.එම්.සන්ධ්‍යා කුමාරි මිය - සංවර්ධන නිලධාරි - කමිටු සාමාජික

4.ආර්.එම්.සුභාෂණි රාමනායක මිය - සංවර්ධන නිලධාරි - කමිටු සාමාජික

5.එම්.ඩී.සී.පී.දයාරත්න මයා - ආදායම් පරීක්ෂක - කමිටු සාමාජික

6.කේ.එම්.ඩී.සුගත් මයා - ආදායම් පරීක්ෂක - කම්ටු සාමාජික

7.බී.එම්.ටී.චාමිකර මයා - ආදායම් පරීක්ෂක - කම්ටු සාමාජික

ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසුව, එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**05.01.09** මොනරාගල දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාල සඳහා 2023 වර්ෂයේ ජනවාරි මස සිට පොදු ආකෘති පත්‍ර භාවිතා කිරීමට අදාල බුත්තල ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන බුත්තල,පැල්වත්ත,ඔක්කම්පිටිය මහජන පුස්තකාලය සඳහා භාවිත කිරීමට ත්‍රෛභාෂා අයදුම්පත්‍ර මේ සමඟ ගරු සභාවේ අනුමැතිය සඳහා යෝජනා කරන්නීය.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී.ඩබ්.ඒ.ප්‍රියදර්ශන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසුව, එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**05.01.10** බුත්තල ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන බුත්තල,ඔක්කම්පිටිය,පැල්වත්ත මහජන පුස්තකාලවල 2023-2027 දක්වා පස් අවුරුදු සැලැස්ම ගරු සභාවේ අනුමැතිය සඳහා යෝජනා කරන්නීය.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උපසභාපති ඩබ්.ඒ.රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසුව, එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**05.01.02 හදිසි යෝජනා**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා අදහස් යෝජනා ඉදිරිපත් කරමින්**

ගරු සභාවට ඉදිරිපත්ව ඇති ඉල්ලීම්වලට අනුව සභාව සතු යන්ත්‍රෝපකරණ යොදවා ඉතාමත් අබලන් වූ මාර්ග ඉතාකඩිනමින් පිළිසකර කිරීම සුදුසු බව මහ සභාව පොදුවේ එකමතිකව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි පී.ඉන්ද්‍රාණී මුතුකුමාරණ මැතිතුමිය අදහස් දක්වමින්**

ගරු සභාපතිතු එඬරුගලයාය පාර යන්නම බෑ සකස් කරලා දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී.ඩබ්.ඒ.ප්‍රියදර්ශන මැතිතුමා අදහස් දක්වමින්**

කාර්මික නිලධාරි මහතාට කියලා හදිසි පාරවල්වල ඇස්තමේන්තු සකස් කර තිබේ.ඒ සඳහා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ලබා දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා අදහස් දක්වමින්**

හදිසි පාරවල් කඩිනමින් හදාගන්න අවශ්‍යයි. පළමු අදියර විදහට සෑම වසමකම හදිසි පාරවල් ටික සකස් කරලා හදමු. නැවත ඡන්දයක් ආපුවාම මේවා නතර වෙනවා. මේවා ඡන්දය බලා ගෙන කරන කටයුතු නොවේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී.ලසන්ත පුෂ්පකුමාර මැතිතුමා අදහස් දක්වමින්**

වීථි ලාම්පු අක්‍රීය වෙලා තියෙනවා අපේ වසමේ.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා අදහස් දක්වමින්**

විදුලි බල මණ්ඩලයෙන් දන්වලා තිබෙනවා දින 14ක් ඇතුළත ගිවිසුම් ගත වෙලා ඒවා ගෙවන්න කියලා. අපට ප්‍රශ්නයක් වෙනවා මුදල් ගෙවන්න කියලා ලිපියක් එවලා තියෙද්දි වීථි ලාම්පු සවිකලා කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී.ලසන්ත පුෂ්පකුමාර මැතිතුමා අදහස් දක්වමින්**

වීථි ලාම්පු වලට නම් ලයිට් එක දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා අදහස් දක්වමින්**

මේ සඳහා ගරු සභාවේ එකමතික එකඟතාවය ලැබුණි.වසමකට දෙන්න පුළුවන් සීමාවක් තිබෙනවා. කැඩිච්ච ඒවා බලලා දාමු.

**06 කාරක සභා වාර්තා සලකා බැලීම හා දින නියම කර ගැනීම .**

**07 ලැබීම් හා වියදම් පිළිබද මාසික ප්‍රකාශ එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කල යුතු වෙනත් ලේඛන :-**

**බුත්තල ප්‍රාදේශීය සභාව**

**2022 නොවැම්බර් මස ලැබීම් ගෙවීම් වාර්තාව**

| | මුදල (රු) | එකතුව (රු) |
|---|---|---|
| මුදල් පොතේ ඉදිරියට ගෙනා ශේෂය | | 6,493,551.91 |
| වරිපනම් හා බදු | 55,018.50 | |
| කුලී | 321,102.15 | |
| බලපත්‍ර ගාස්තු | 163,600.00 | |
| සේවා සඳහා ගාස්තු | 256,055.94 | |
| වරෙන්තු ගාස්තු | 505,743.30 | |
| වෙනත් ආදායම් | 976,397.89 | |
| වෙනත් ආධාර | 4,937,079.56 | |
| මූලධන ලැබීම් | - | |
| සේවක ණය | 253,012.00 | |
| තැන්පත් | 312,800.00 | |
| අධිකතා මා ඌනතා | - | |
| අත්තිකාරම් | 8,830.00 | |
| මුදල් හුවමාරු කිරීම | - | |
| මුද්දර | 4,650.00 | |
| | | 7,794,289.34 |
| මුළු ගෙවීම් | | 9,893,065.43 |
| | | 4,394,775.82 |
| ලැබීම් හා ගෙවීම් අතර ශේෂය | | |

යන්ත්‍රෝපකරණ ගිණුම

| ලැබීම් විස්තරය | මුදල (රු) | එකතුව (රු) |
|---|---|---|
| මුදල් පොතේ ඉදිරියට ගෙනා ශේෂය | | 227,315.36 |
| සේවා සඳහා ගාස්තු | - | |
| වරෙන්තු ගාස්තු | | |
| වෙනත් ආදායම් | 1,823,925.19 | |
| සේවක ණය | | |
| අත්තිකාරම් | | |
| මුද්දර | 50 | |
| තැන්පත් | - | |
| මුළු එකතුව | | |
| | | 1,823,975.19 |
| | | 674,507.80 |
| මුළු ගෙවීම් | | 1,376,782.75 |
| ලැබීම් හා ගෙවීම් අතර ශේෂය | | 1,376,782.75 |

## යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් විස්තරය - 2022 -ඔක්තෝබර්

| දළ ආදායම | | | දළ වියදම් | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| යන්ත්‍රෝපකරණයේ /වාහනයේ අංකය | මුදලට වැඩ වටිනාකම | පොදු වැඩ වටිනාකම | ඉන්ධන සඳහා වියදම් | අමතර කොටස් හා අළුත් වැඩියාව සඳහා වියදම් | යන්ත්‍ර ක්‍රියාකරු ගේ/සහාය කගේ වැටුප් | යන්ත්‍ර ක්‍රියාකරුගේ/ සහායකගේ ගමන් වියදම් | මුළු වියදම | ලාභය /පාඩුව |
| LL-7310 ලොරි ජල බවුසරය | 289,619.00 | - | 128,140.00 | - | - | - | 128,140.00 | 161,479.00 |
| ZA-3167 ලෝඩර් බැකෝ යන්ත්‍රය | 49,700.00 | 109,200.00 | 58,566.00 | 15,732.00 | | | 74,298.00 | -24,598.00 |

*බැකෝලෝඩරය හා ටිපර් රථ මිලදී ගැනිම සඳහා දේශිය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය මුදලේ මාසික ණය වාරිකය රු.157334.08

*මෝටර් ග්‍රේඩරය හා මාර්ග තලනය ලබා ගැනීම සඳහා දේශිය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය මුදලේ මාසික ණය වාරිකය රු.132773.55

ලැබීම් ගෙවීම් වාර්තාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.ඒ.රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා එම්.ඩී.ඩබ්.ඒ.ප්‍රියදර්ශන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් 2022 ඔක්තෝබර් මස ලැබීම් ගෙවීම් වාර්තාව සඳහා සභාවේ එකගතාව විමසීමෙන් පසුව එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

### 08. වෙනත් කරුණු :-

### 01.සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම.

2023.01.12 දින පෙ.ව 9.30 ට ප්රාදේශීය සභා ශ්‍රවනාගාරයේදී 2023 ජනවාරි මස මහ සභා වාරය පැවැත්වීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.ඒ. රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.ලසන්ත පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසු බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

### 02.නොපැමිණි සභිකවරුන්ගේ නිවාඩු අවසරය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි කේ.එල්.එස්.ආර්.ජයකොඩි මැතිතුමිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.කේ.කේ.දෙනුක කසුන්ජිත් මැතිතුමා අසනීප බව දුරකථනයෙන් දැනුම් දෙමින් නිවාඩු ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. ඒ අනුව, මන්ත්‍රීතුමන් වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.ලසන්ත පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව බෙදීමක් නොවූයෙන් නිවාඩු අනුමත කරන ලදී.

**04.ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් ඉදිරිපත් කිරීම.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී.ඩබ්.ඒ.ප්‍රියදර්ශන මැතිතුමා අදහස් දක්වමින්**

ගරු සභාපතිතුමා මන්ත්‍රීතුමන්ලා හා ලේකම්තුමියගෙන් අවසරයි.රජයෙන් ලබාදුන් පොහොර රජයේ රැකියා කරන නොකරන සියලු දෙනාට යම් යම් ක්‍රමවේදයන්ගෙන් පොහොර ලබාදීලා තිබෙනවා.රජයෙන් ලබාදෙන පොහොර ගොවියාට නිසි ලෙස ලැබීලා නෑ.එම පොහොර ටික නිසි ලෙස ලබාදීම සුදුසු බව මම යෝජනා කරනවා.ඉදිරියේදී කොම්පෝස්ට් පොහොර රජයෙන් ලබාදෙනවා කියලා පණිවිඩයක් ලැබිලා තිබෙනවා.ඒවත් ගොවියින්ට අහිමි වෙන්න පුළුවන්.එම නිසා අදම ලිපියක් යොමු කර ඒ පිළිබඳව දැනුවත් කරන්න කියලා ඉල්ලීමක් කරනවා.මම යුදගනාව කොට්ඨාසයේ උනාවටුන වසමේ මාර්ග කාපට් කරලා ඉවරයි.තව ටිකක් ඉතිරිවෙලා තියෙනවා.නිවාස සංවර්ධන අධිකාරියෙන් නිවාස 13 ක් අනුමත කරගෙන තිබෙනවා.අරගලේ ආවේ නැත්නම් මම ඒ දේ කරනවා.ඔබතුමන්ලා දීනුවොත් ඒ දේවල් කරලා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.ඒ.රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා අදහස් දක්වමින්**

ගරු සභාපතිතුමා මන්ත්‍රී මණ්ඩලය,ලේකම්තුමියගෙන් අවසරයි.අද දින සභාවේ ලෙඩ නිවාඩු දාලා තියෙන්නේ මං නිසා.ඒක මම ඔබතුමන්ලාට කියන්න ඕනි.දෙසැම්බර් මස පළවෙනිදා ප්‍රසම්පාදන කමිටුව තිබුණා.එකට ඇවිල්ලා ලේකම්තුමියගෙන් ඇහුවා අපේ සභාවේ අවුරුදු 05කට වැඩි සේවකයෝ යවන්න ලියුම ගැහුවද කියලා ආණ්ඩුකාරතුමාට.ඊට ඉස්සල්ලා මේ ලියුම කොමසාරිස්තුමාටත් මම මේ කියන සියලුම දේ යවන්නත් ඕනි.ලේකම්තුමිය මට දුන්න 11/23 ලිපිය ඊට කලින් මට දැනගන්න ඕනි යැව්වද කියලා. ඉන් පසුව 12/1 කමිටුවේදී මම ඒ ගැන ඇහුවා.ඔව් යැව්වා කිවුවා.කමිටුව ඉවර වෙලා මට පොත් දෙක භාර දෙන්න කියලා කිව්වා.මට අයිතියක් තියෙනවානේ.මම උප සභාපතිනේ.මම මන්ත්‍රීතුමන්ලාටත් කිවුවා.පොතක් තියෙනවා ඒකේ ලකුණු වෙන්න ඕනි. පොත්වල ලකුණු වෙන්න ඕනි. ඊට පස්සේ සභාපතිතුමා ගියා රැස්වීමකට. ලේකම්තුමියත් ගියා.මහේෂ් මහත්තයාට මම කිව්වා බලන්න කියලා. පැය භාගයක් විතර හෙව්වා. දාපු තැනක් නෑ. ඊට පස්සේ කසුන් කිව්වා. උපසභාපතිතුමා තැපැල පොත් දෙකේ නැත්නම් යවලා නෑ කියලා. මම කිව්වා සභාපති මහත්තයා දාන බබා පාට් මම දාන්නේ නෑ කියලා. මේ පොත් හොයලා තියන්න කියලා මම ගෙදර ගියා. ගෙදර ගිහිල්ලා ආණ්ඩුකාරතුමාට කෝල් එකක් දුන්නා. 1.22 ට ආණ්ඩුකාරතුමාගෙන් මම ඇහුවා ගරු ආණ්ඩුකාරතුමණි මම කතා කරන්නේ බුත්තල උපසභාපති කියලා. ඊට පස්සේ මං ගත්තා දිනේෂ් මහතාට. මං ඇහුවා ඔබතුමාට මේක භාරගන්න සභාවෙන් තීරණයක් ගත්තා අවුරුදු 05ට වැඩි අය මාරු කරන්න ඒ ලියුම ආවද කියලා. නෑ මට ආවේ නෑ. ඉන්න මං බලලා කියන්නම් කියලා පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් ඇහුවා. ඊට පස්සේ බලලා කිවුවා නෑ කියලා. ඊට පස්සේ මං කතා කරා ලේකම්තුමියට. මේ ලිපිය නෑ කිවුවා. හා මං දැන් ලිපිය ෆැක්ස් කරන්නම් කිවුවා. එතකොට මේක බොරුවනේ කරේ. එදා ෆැක්ස් එක දැම්මගෙන් මේ ලිපිය ලැබිලා තියෙන්නේ. මතකනේ එක දවසක් පක්ෂ ලිපියක් පිළිබඳව ප්‍රශ්නයක් වෙලා මම ඒකත් ඇද්දා මෙතනදී. ඉතින් මේවා මන්ත්‍රීලා ගන්න තීරණයක්නේ.හරි තීරණයක් මේ නිලධාරි කරන්නේ නැත්නම් සභාපති මහත්තයා නලවනවා වගේ මං නලවන්නේ නෑ කියලා මම එතනින් බැහැලා එළියට ගියා. ඒ ටිකට තමයි අද ඔය ලියුමක් ගහලා වැඩ වර්ජන දාලා තියෙන්නේ. ඒකට මං හිතන්නේ දාලා තියෙනවා තව එකක්. දවසක් මම යනකොට ඕබී ගගහ හිටියා යන්ත්‍රෝපකරණ ඒකකයේ. මං මහේෂ් මහත්තයාගෙන් කෝල් එකක් දීලා ඇහුවා මොකක්ද මේ වැඩේ කියලා. ඊට පස්සේ මහේෂ් මහත්තයා කිවුවා දන්නේ නෑ. සභාපතිතුමාට කිව්වාද දන්නේ නෑ. සභාවේදීත් මම කිවුවා මෙහෙම වැඩක් වෙනවා. මම යනකොට ඔක්කොමලා ඕබී ගහනවා කියලා. මාධ්‍යටත් කිව්වා. මාධ්‍ය දාලා තිබුණා. බූරු ගහලා අහුවෙලා සභාවේ යන්ත්‍රෝපකරණ ඒකකයේ අය උද්ඝෝෂණයක් පවත්වලා කියලා. වැඩවර්ජනයක් දාලා ඊට පස්සේ දවස් දෙක තුනකට පස්සේ මම ඒවා කතා කලා. තවත්

කෙනෙක් තමයි හිටපු කාර්මික නිලධාරි මහත්තයා. මමත් බට අරන් දුන්නා කඩෙන් ණයට ඒකෙනුත් 5%ක් ඉල්ලලා තිබුණා. ඇත්තම කියන්න එපැයි ලියුමක් ගෙන්නලා කාර්මික නිලධාරි මහත්තයාට කිව්වා ආය ගෙවන්න එපා මෙහෙමයි කියලා කිවුවට පස්සේ මාස ගානක් ඇද්දා. මම ඇහුවා බඩු ගන්න කඩෙන්. ඊට ගේනවා කියලා සභාපති මහත්තයාටත් කියලා ලක්ෂ 5ක් අරගෙන ඒ ටික ගෙව්වාට පස්සේ දෙන්නේ නැතුව 5%ක් දෙන්නේ නැති නිසා මොනවා හරි කියලා කොහොම හරි රුපියල් හතළිස්දාහක් පනස්දාහක් කපාගත්තා. ඊට පස්සේ මම ඒකට කෑ ගැහුවා. ඇයි කාර්මික නිලධාරි මහත්තයා ඔය වගේ අසාධාරණ වැඩ කරන්නේ කියලා. කාර්මික නිලධාරි මහත්තයාට 5%ක් ගන්න කියන්නේ කොන්ත්‍රාත්කාරයත් හොරකම් කරනවානේ. ඒකයි. අද ලියුමක් ගහලා තියෙනවා. ඒ ටික තමයි මේ අරගලයට අද නිවාඩු දාලා තියෙන්නේ. එදා මම පළවෙනිදා කතා කරලා ගියාට පස්සේ මට මෙහෙන් කෝල් එකක් දුන්නා සභාපති මහත්තයත් එක්ක සාකච්ඡාවක් තියෙනවා ඒ කට්ටිය. එතනදීත් කතා වෙලා තියෙනවා මං සභාවට එන වෙලාවකට මගේ ඇගේ හැප්පිලා හරි වලියක් දාගන්නවා කියලා. වගකීමෙන් කියන්නේ. මං ඊට පස්සේ සභාපති මහත්තයාගෙන් කෝල් කරලා ඇහුවා. මෙහෙමයි මෙහෙමයි කියලා විස්තරේ කිව්වා. ඒක නිසා මං සමථයට පත්වුණා කියලත් කිව්වා. ඊයෙත් මං මේ පාවාදීමක් නෙවෙයි කියන්නේ ඊයෙත් කෝල් එකක් දීලා කියලා තියෙනවා සභාපති මහත්තයත් එක්ක උපසභාපතිතුමත් සමග සාකච්ඡාවක් තියන්න ඕන කියලා එන්න කියලා. ඊයේ දෙකට කෝල් කළා. එතකොට මට මේ බව දැනුම් දුන්නේ. මෙහෙම ලෙඩ නිවාඩු දාලා ලිපියක් දුන්නා කියලා. මට කිව්වෙත් නෑ. මම දන්නෙත් නෑ. ඊයේ හැන්දෑවේ හවස 5 ට විතර ලේකම්තුමියත් මට කෝල් කළා සාකච්ඡාවක් තියෙනවා කියලා. මෙහෙම කරන්න එපා සභාපතිතුමා අපි රුපියලක්වත් හොරකම් කරලා නෑ. දරුවන්ට කන්ඩ දීලත් නෑ. මේ සභාවෙන්. ඒකයි හිතට අමාරු. අනිත් එක හොරුන්ට ඉඩ දෙන්න එපා ඕවා කරන්න. සභාපති මහත්තයා ඒ හොරු තියාගන්න වටිනවනම්. මේ සභාවේ මම යෝජනා කරේ අවුරුදු 5ට වඩා වැඩි කට්ටිය ඉන්නවානම් මාරු කරන්න කියලා. ඒ දැක්ම තමයි මේ නිලධාරි මහත්වරුන්ගෙන් තියෙන්නේ. ඒක මං හිතන්නේ මේ සභාවෙන් ගියත් ඒ කැක්කුම තමයි මේ නිලධාරි මහත්වරුන්ටත් තියෙන්නේ. මට ඊයේ රෑ සී.අයි.ඩී. එකෙන් කෝල් කරා. මම සියලු විස්තර ඔක්කොම දුන්නා. සභාපති මහත්තයා ඔබතුමා හොරකම් කරාද නැත්ද කියලා දන්නේ නෑ. හොරු ආරක්ෂා කරන්න එපා. මට සෑහෙන්න හිතට අමාරුයි. මම අසාධාරණ පැත්තට කතා කරලා සභාවේදීත් සාධාරණ පැත්ත කතා කරනවා. අසාධාරණ වලට මම කැමති නෑ. මොන ආණ්ඩුව ආවත් මේ අරගලකරුවන් එක්ක මන්ත්‍රීතුමන්ලාටත් යන්න බෑ. පාර්ලිමේන්තුව දක්වා නැති කරන්න ඕන. මම බය නෑ ඕන සී.අයි.ඩී. එකකට අරන් යන්න. ඔය එකකටවත් කෝල් කරලා කට්ටිය මට කිවුවා මම අහවලා අහවලා කියන්නේ නෑ. ලෙඩ නිවාඩු මමත් දානවා ඒක ඔක්කොම ගන්න තීන්දුවක්නේ ඒක නිසා කියලා. මම කිවුවා කමක් නෑ ඔයත් නිවාඩු දාන්න කියලා. ඊට පස්සේ ලේකම්තුමියගෙන් මම ඇහුවා ඔබතුමිය සභාවට එනවද කියලා. ඔව් කිවුවා. මම කිවුවා ඔබතුමිය අනිවාර්යයෙන්ම එන්න ඕනි කියලා. ලේකම්තුමිය ඉන්නවා නම් ඇති අපට. ඉන්න කට්ටිය හරි කරනවනේ. ඒක සභාවේ මන්ත්‍රීවරුන්ටත් එන ප්‍රශ්නයක්. ඒ වගේම සාධාරණියකත්වයක් තියෙන්න ඕනි. මහජනතාව අපෙනුත් අහනවනේ. මේ සභාවෙන් රුපියලක්වත් හොරෙන් අරන් නෑ මං ගන්න මිනිස්සු ඉන්නවා නම් ඒව හෙන හරි ගහයි. හෙන හරි වැදෙයි. බුද්ධ ධර්මයට අනුව ළමයෙක් හරි ලෙඩ වෙනවා. අපට ඒ දේවල් ස්වභාවධර්මයෙන් හරි ලැබෙනවා. මට ඇඬෙනවා මේ වැඩේට. මෙච්චර අපි අවංකව සේවය කරලා මෙතනට එන්නේ ඒ නිසා මම සාධාරණයි. සාධාරණේ කවදාහරි ජයගන්නවා ජයගන්නවාමයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජීව ප්‍රදීප් මැතිතුමා අදහස් දක්වමින්**

මෙච්චර කාලෙකට මෙහෙම දෙයක් වෙලා නෑ.උප සභාපතිතුමා ලේකම්තුමියගෙන් නිතර නිතර ඇහුවා.මෙතුමිය අපහසුතාවයට ලක්වුණා.අපි විපක්ෂයේ කට්ටිය අපිට අදාලත් නෑ මේවා කතා කරන්න.ඉදිරියේදීවත් විනය පිළිබඳව දැනුවත් කරන්න.මේ අවුරුදු 04 දී අනවසර කඩයක් දාලා තියෙනවා.ඒවා අකටයුතුකම්.ගරු සභාපතිතුමා මේ එන වසරේදී මැතිවරණයක් ගැන මම හිතන්නේ නෑ.කෝටි 07,08 ක් වියදම් කරලා රජයෙන් කරයි කියලා. එත් අපේ යෝජනාවලට වැඩක් කරන්න පුළුවන්

වෙලා නෑ.අරගලයක් නැතුව කිසිදෙයක් විසදෙන්නේ නෑ.අරගලයත් එන්න ඕනි.මම ලේකම්තුමියට කියන්නේ කෙලින් වැඩ කරන්න.නිවැරදි තීරණ ගන්න.ලබන්නා වූ 2023 වසර සුභ වන වසරක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.සුනිල් මැතිතුමා අදහස් දක්වමින්**

සභාපතිතුමා උපසභාපතිතුමා ඇතුළු ලේකම්තුමියගෙන් අවසරයි.මේ මාසික මහ සභාවේදී මම සියලු දෙනාට ස්තූතිය පුදකරනවා.කළුපහන මන්ත්‍රීතුමා මත්ද්‍රව්‍ය පිළිබඳව කතා කළා.රටේ අහිංසක දූ දරුවන් බේරා ගැනීමේ අවශ්‍යතාවය පවතිනවා.විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය දුන් කුලපතිවරයාට පවා පහරදී තිබෙනවා.අපි සභාව හැටියට මේ ගැන සොයා බලමු.බුත්තල ප්‍රදේශයේ කතාවක් යනවා ගුරුවරුන්පවා මේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවෙලා කියලා.ගරු සභාපතිතුමණි මේ වැඩ පිළිවෙළ හැකි ඉක්මණින් ක්‍රියාත්මක කරන්න. ලබන්නා වූ 2023 වසර සුභ වන වසරක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා අදහස් දක්වමින්**

සභාපතිතුමා උපසභාපතිතුමා ඇතුළු ලේකම්තුමියගෙන් අවසරයි.පොහොර ගැටළුව සම්බන්ධව අද රට තුළ ආහාර හිඟයක් පවතිනවා.ඒ නිසා නිෂ්පාදකයාට සහයෝගය දක්වන්න කියලා.ඒ අතරේ අක්‍රමිකතා සිදුවෙනවා මේ අක්‍රමිකතා නවත්වන්න ක්ෂේත්‍ර නිලධාරීන් පත් කරන්න.අදාල නිලධාරීන් අදාල වසම තුළ ඇවිදිය යුතුයි.නිලධාරීන් විවේචනය කරනවා නෙවෙයි.ඩෝල් ලංකා යන එක්කෙනෙක්ගෙන් පඩි වාර්තාවක් අරගෙන පොහොර දීලා අපහසුතාවයට පත්වෙලා තිබෙනවා.රජයේ සේවකයන්ගෙන් මේ දේ කළත් කමක් නෑ.ඩෝල් ලංකා එකේ ඉන්නේ දවසේ වැටුප් ලබන මිනිසුන්.මේ දේවල් හරියට කරන්න ඕනි.අලි ගැටළුව ගැන දීර්ඝ කාලයක් අපි කතා කරනවා.මේ පිළිබඳව ගම සහ වනජීවී දෙපාර්තමේන්තුව අතර ලොකු අර්බුදයක් තිබෙනවා.ගෝනගංආර වසමේ ඇතෙක් කඩා පැනලා පාසලේ ජල ටැංකිය පොඩි කරලා විනාශ කරලා තිබෙනවා.පසුදා උදේ සහකාර අධ්‍යක්ෂ ගැටළුවට මුහුණ දුන් අය අල්ලලා හිරේ දැම්මා.මේවාගෙන් සහයෝගීතාවය බිඳවැටෙනවා.වනජීවී දෙපාර්තමේන්තුවත් මේ පිළිබඳව වැඩි සැලකිල්ලක් නෑ.අපි කාටද එතකොට දැනුම් දෙන්නේ.අලාභය ගෙවන්නේ මිනිස්සුන්ට පිටරටට ණයවෙලා ඒක නිසා අපි සියලු දෙනාට වගකීමක් මේ පිළිබඳව සොයා බලා ගමේ මිනිසුන්ව තලාපෙලීම නතර කරන්න ඕනි.නැත්නම් ලොකු විනාශයක් වෙනවා.ඒ වගේම මත්ද්‍රව්‍ය ගැන කතා කරපු මන්ත්‍රීතුමන්ට ස්තූති වන්ත වෙනවා.සභාපතිතුමණි ඒ පිළිබඳව වැඩපිළිවෙල හැකි ඉක්මණින් ක්‍රියාත්මක කරන්න.2023 වසරේ විසුරුවා හැරියත් අපි සියලු දෙනාට සහයෝගයෙන් වැඩකටයුතු කරන්න ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.එම්.එච්.ශාන්ති රත්නායක මැතිතුමා අදහස් දක්වමින්**

අපට බුත්තලට අවශ්‍ය ආමි කැම්ප් එකේ තියෙන පිට්ටනිය ගැන.අපේ දැරුවන්ට ඒ දේ අහිමිවෙලා.අපේ සභාවේ කාලේ ඉවර වුණත්,මේ දේවල් සභාවට අයිති කරගෙන ආදායම අරගෙන අදාල තැන්වලට ලිපි යවලා මේ දේ දරුවන්ට හිමිකර දෙන්න.අපේ වසමට ලයිට් නෑ.වන අලි ගැටුම තියෙනවා.මිනිසුන්ට රස්සාවලට යන්න නෑ වන අලි ප්‍රශ්නේ නිසා.අදාල තැන්වලට ලිපි මගින් දැනුම් දෙන්න.බීජ ලබාදීමේදී පොහොට්ටුවේ සමිතියක් හදාගෙන බීජ බෙදලා තියෙනවා.තව ලිස්ට් එකක් තියෙනවා මට බීජ ලබා දෙන්න. ජයකොඩි මන්ත්‍රීතුමිය ලිස්ට් එකකට බීජ ලබාදී තිබෙනවා.මිනිස්සුන්ගේ ඡන්දය ගන්නනම් සියලු දෙනාට දෙන්න ඕනි.අදාල නිලධාරීන් ඒ ගැන බලන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී.ඩබ්.ඒ.ප්‍රියදර්ශන මැතිතුමා අදහස් දක්වමින්**

ගරු සභාපතිතුමණි,උපසභාපතිතුමා පිළිබඳව නිලධාරීන් මහජන නියෝජිතයන්ගේ වැඩකටයුතු නතර කරලා එයාලා ලෙඩ නිවාඩු දැම්මා.එක හරි අසාධාරණයි. යම් නිලධාරීන් අතින් වැරදි වුණා.යම් යම් වේලාවන්වල අපි කිසිම නිලධාරීයෙකුට වැරදි කියලා නෑ.උපසභාපතිතුමා අතින් වැරදීමක් වෙන්න ඇති.නමුත් නිලධාරීන්

ලෙඩ නිවාඩු දාලා උද්ඝෝෂණය කරන්න අවශ්‍ය නෑ. ලබන්නා වූ 2023 වසර සුභ වන වසරක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලසන්ත ලක්මාල් මතහවීර මැතිතුමා අදහස් දක්වමින්**

මගේ වසමේ මාර්ග කිලෝමීටර් 26 ක් පමණ අරගලය නිසා අතරමඟ වැඩ නතර වී තිබෙනවා.වර්ථමාන තත්ත්වයත් එක්ක ඉදිරියේදී ඒවා කෙරෙයිද දන්නේ නෑ.එඬරුගලයාය මාර්ගය හදන්න සල්ලි පාස් වෙලා සියලු වැඩ ආරම්භ කරන්න විතරයි තිබුණේ.ඒවත් දැන් නැවතිලා තියෙන්නේ.ලබන වසරේ ඒ වැඩකටයුතු ආරම්භ කරන්න පුළුවන් වෙයි.මේ සභාවෙන් එළියට ගියත් මම සතුටින් යනවා.මම දීමනා විතරක් ගත්ත කෙනෙක් නෙවෙයි.මම මිනිස්සුන්ට වැඩ කරලා තිබෙනවා.මම ඊයේ සභා දිනය වැරදිලා සභාවට ආවා.එතකොටයි නිලධාරීන්ගේ කාරණය ගැන දැනගන්න ලැබුණේ.අපි ඊඟ මැතිවරනයේදී ආවත් නාවත් අපි ණය නෑ.ලබන්නා වූ 2023 වසර සුභ වන වසරක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.තිලකරත්න මැතිතුමා අදහස් දක්වමින්**

පොහොර සම්බන්ධව අපේ ප්‍රදේශවලත් ප්‍රශ්න ආවා.මත්ද්‍රව්‍ය පිළබඳව අනවබෝධයෙන් ඉන්නේ.සමහර දරුවන්ටද අවබෝධයක් නෑ.අත්පත්‍රිකා බෙදීම ගොඩක් වටිනවා.අවුරුදු 35ට එහාගිය දේවල් සමහර මන්ත්‍රිවරු කියනවා.අද තරුණ තරුණියෝ ඒවා පිළිගන්නේ නෑ.මේ කාලය තුළ පවතින පීඩනයත් එක්ක ඒ ගැන අවබෝධයෙන් ඉන්නේ සියලු දෙනා.පාරවල් හදන එක ගැන වසන්ත මන්ත්‍රිතුමා කිව්වා.අප ඒවා හදලා දෙනවා.ඔබතුමා වැඩ කරපු ඒවා ගැන අපට සඳහන් කරන්න අවශ්‍ය නෑ.අපට චෝදනා එනවා .අපි ඒවා පිළිබඳව අවධානය යොමු කරන්නේ නෑ. ලබන්නා වූ 2023 වසර සුභ වන වසරක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි කේ.එල්.එස්.ආර්.ජයකොඩි මැතිතුමිය අදහස් දක්වමින්**

සභාපතිතුමා උපසභාපතිතුමා ඇතුළු ලේකම්තුමියගෙන් අවසරයි.සභාපතිතුමණි,මගේ නිවස අසල සිටින මන්ත්‍රීතුමියට බීජ ලැබිලා නෑ කිව්වා.පක්ෂ භේදයකින් තොරව සියලු දෙනාටම බීජ බෙදුවා. ආර්ථික සංවර්ධන නිලධාරිතුමා, කෘෂිකර්ම නිලධාරිතුමයි ලිස්ට් එක හැදුවේ. රාජ්‍ය සේවකයින්ටත් මේක ගෙවතු වගාවක් ලෙස කරන්න කියලා මමත් ලිස්ට් එකක් දුන්නා. ඉතුරු වුණ බීජ ඒ අයට බෙදලා දුන්නා. කිසිම සමිතියක් නෑ. මහගොඩයාය වසමට තෝරලා බේරලා දුන්නේ නෑ. මට කවුරුත් ඕන නෑ. ලබන අවුරුද්දේ ඡන්දයක් තියෙන්නත් පුළුවන්. නැතිවෙන්නත් පුළුවන්. ලබන්නා වූ 2023 වසර සුභ වන වසරක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සී.අත්තනායක මැතිතුමා අදහස් දක්වමින්**

ගරු සභාපතිතුමා උප සභාපතිතුමා ලේකම්තුමියගෙන් අවසරයි. මොකක්ද මේ රජයේ නිලධාරින් කියන්නේ. මහජනතාවගේ සේවකයෝ එයාලා කරපු දේ වැරදියි. එයාලා වගකීම පැහැර හැරියා. මේ සභාවට ඇවිල්ලා ඔක්කම්පිටිය රෝහලේ මෝචරියට යන්න පාරක් තිබුණේ නෑ.ඒක හැදුවා. ගමටත් සේවය කරලා තියෙනවා. උපසභාපතිතුමා කෙලින් කතා කරන කෙනෙක් මමත් නිලධාරින්ගේ ප්‍රශ්නය දන්නේ එතනට ආවාට පස්සේ සභාපතිතුමා හිටියා නම් ඒ දේ නතර කරන්න තිබුණා. මම ගොවි සංවිධානයේ සභාපතිතුමා මම ඉහළ නිලධාරින්ගේ විමසුවා. පොහොර බෙදා දීම සම්බන්ධව කොළඹින් තමයි ඒ ලිස්ට් එක හදලා තියෙන්නේ. පොහොර මිටිය නොමිලේ ලැබෙන්න ඕනි දෙයක්. අභියාචනා ඉදිරිපත් කරන්න කිවුවා. රජයේ නිලධාරින්ට පොහොර දුන්නට කමක් නැහැ. අපේ ගමේ රජයේ නිලධාරින් ගොඩක් අය ගොවිතැන් කරනවා. අලි වැට භාරව ඉන්න අය වනජීවී රජයේ වැඩිම සල්ලි තියෙන ආයතනයක්. ඒ දේවල් වගකීමෙන් කරන්න ඕනි. අලි ඉන්නේ ගම ඇතුළේ වනයේ නෙවෙයි. අපි ඒ ගැන හැමදාම කතා කරනවා. මේවා හිස් වචන විතරයි. පාර්ලිමේන්තුවෙත් මේ ගැන කතා කරනවා. මේ දේවල් විසඳෙන්නේ නෑ. තිලකරත්න මැතිතුමා ඡන්දය ගැන

කතා කළා. මේ දේවල් ජේ.වී.පී.එකෙන් කඩා කප්පල් කළා. පාසල් ළමයින්ට අධ්‍යාපනය නැති කළා. බස් ගිනි ගැහුවා. මාධ්‍යවේදීන් මැරුවා. හාමුදුරුවෝ මැරුවා. වර්තමානයේ තරුණ තරුණියෝ මේ දේවල් වටහාගෙන තියෙන්නේ. ඒ අය බුද්ධිමත් අය. තවත් ජේ.වී.පී.එකට ඡන්දය දෙයි කියලා මම නම් හිතන්නේ නෑ. ලබන්නා වූ 2023 වසර සුභ වන වසරක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්ද්‍රසේන ලියනආරච්චි මැතිතුමා අදහස් දක්වමින්**

ගරු සභාපතිතුමා උප සභාපතිතුමා ලේකම්තුමියගෙන් අවසරයි. මහජන පුස්තකාලවලට අවශ්‍ය බඩු මුට්ටු ටිකක් තියෙනවා. ඒවා ලබා දෙන්න ඕනි. මෙතන අනාරක්ෂිතයි. සී.සී.ටී.වී.කැමරා සවි කරන්න කියලා මම කියනවා. ලබන්නා වූ 2023 වසර සුභ වන වසරක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා අදහස් දක්වමින්**

සියලු දෙනාට සුභ දිනයක් ප්‍රාර්ථනා කරමින් අද දින ප්‍රාදේශීය සභාව තුළ සිදු වූ කාරණය පිළිබඳව කණගාටුව ප්‍රකාශ කර සිටිනවා. ඊයේ සවස මා හට කාර්ය මණ්ඩලය ලිපියක් ලබා දෙමින් උපසභාපතිතුමාගේ ක්‍රියා කලාපයන්ට විරෝධය පල කරන බවත්, ඊට අසනීප නිවාඩු දමා සේවයට නොපැමිණ වෘත්තීය ක්‍රියාමාර්ග ගන්නා බව දැනුවත් කරන ලදී. මෙහිදී සියලු නිලධාරින් කැඳවා එවැනි ක්‍රියාදාමයකට නොයෙන ලෙස ඉල්ලා සිටී අතර මාද විශ්වාස කළේ එවැනි ක්‍රියාමාර්ගයක් නොකරනු ඇති බවයි. මෙහිදී මා මධ්‍යස්ථව කටයුතු කරනවා. උපසභාපතිතුමා හා කාර්ය මණ්ඩලය හරි යැයි කියන්නේ නෑ.

පාසල් තුළ මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා ප්‍රදේශයේ සියලු විදුහල්පතිතුමන්ලා රැස් කර ඊට ගත යුතු විසඳුම් පිළිබඳව සාකච්ඡා කිරීමට මම ඉදිරියේදී දිනයක් යොදා ගන්නවා. පැල්වත්ත සීනී කර්මාන්තයේ මතුව ඇති ගැටලුව ඊට වගකිව යුතු බලධාරී විසින් ඊට කඩිනමින් විස දිය යුතුව ඇත. එසේ නොවුන හොත් ආයතනයට මෙන්ම සමස්ත ප්‍රදේශයටම බලපානු ලබන කරුණක් වේවි.

වන අලි ගැටලුව පිළිබඳව දිගින් දිගටම අදාළ අංශ සමඟ නිරන්තරයෙන් කතා කළා. ඊට ක්‍රියාමාර්ග ගන්නා ලෙස ලිපියක් මගින් දැනුම් දී තිබෙනවා. පසුගියදා පැවති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී කතා කළා. වෙනම සාකච්ඡාවක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පවත්වා තිබෙනවා.

අපි මහජන නියෝජිතයන් ලෙස 2018 වර්ෂයේ ප්‍රාදේශීය සභාවට පැමිණෙන විට ආණ්ඩුව වෙනත් පැත්තක ප්‍රතිපාදන නොලැබී අවුරුදු 02ක් පමණ කටයුතු සිදු කිරීමට වූවා. ඉන් අනතුරුව සහරාන් සිදුවීම, කොවිඩ් වසංගතය රටේ ආර්ථිකය බිඳ වැටීම දේශපාලන අස්ථාවරභාවය වැනි අර්බුද රාශියකටම මුහුණ දෙමින් මහජනතාව වෙනුවෙන් පෙනී සිටින ආයතනයක් ලෙස අදාල කාර්ය භාර්යයන් හැකි උපරිමයෙන් සිදු කළා යැයි මා විශ්වාස කරනවා. ගැටළු සහගත තැන් ඇති සමහර විට මේ සභා වාරයෙන් නිල කාලය අවසන්වනු ඇති.ඒ කෙසේ වුවත් ඔබ සැම දෙනා සමාජ ක්‍රියාකාරීන් ලෙස සමාජය තුළ කටයුතු සිදු කිරීමට හැකියාව තිබෙනවා.අද දින සභාකටයුතු සිදුකර ගෙන යාමේදී ගරු උප සභාපතිතුමා මන්ත්‍රී මණ්ඩලය දැක්වූ සහයද අද දින කුමන ගැටළු තිබුණද ලේකම්තුමිය දැක්වූ සහය ද කෘතවේදීව සිහිපත් කරමින් සහයදැක්වූ සැමට නැවතත් ස්තූතිය පුදකරමින් ලබන්නා වූ 2023 වර්ෂය සැමට සෞභාග්‍යමත් නව වසරක් වේවායි පතමි.

සැම කටයුත්තක් සඳහා ම ලබාදුන් සහයෝගය වෙනුවෙන් සියලු දෙනාට ස්තූතිවන්ත වන බවත්, අද දින සභාවාරය සඳහා සහභාගි වූ උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාට මෙන්ම ලේකම්තුමිය ප්‍රමුඛ කාර්ය මණ්ඩලයේ සැමට ස්තුති කරන ලදී.

සභාවේ කටයුතු ප.ව.1.00 ට අවසන් කරන ලදී.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

පිටපත්:-

01 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව , බදුල්ල

02 සහකාර පළාත් පාලන කොමසාරිස් , සහකාර ප.පා.කොමසාරිස් කාර්යාලය,මොනරාගල.

03 විගණන අධිකාරී, විගණන උප කාර්යාලය , මොනරාගල.